
ආරම්භය : 1945-09-30 ලි.ප. අංකය : කො 39/482
ධර්ම දානය පිණිස සෑම පුර පසලොස්වක් පොහෝ දිනයක් පාසා නිකුත් කරන
දෙහිවල බෞද්ධෝදය සංගමයේ මාසික ධර්ම පත්‍රිකාව



69 වර්ෂය - ශ්‍රී. බු. ව. 2558 2014 ජූලි 12 ඇසළ කලාපය

813 මාසික ධර්ම පත්‍රිකාව

ප්‍රජාපතී ගෝතමියගේ චීවර පූජාව !

ගල්කිස්ස ශ්‍රී ධර්මපාලාරාමය සහ කතරගම උපාලි ධම්ගුමාධිපති
ප්‍රවචන කීර්ති ශ්‍රී ශාසන ශෝභන
ශ්‍රී සුමංගල විද්‍යාවතංස - මහෝපාධ්‍යාය අග්ගමහා පණ්ඩිත
කොටුගොඩ ධම්මාවාස අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස

" පඨවි සාගරෝ මේරු - ඛයං යන්ති යුගක්ඛයේ
කප්පානි සත සහස්සානි - සංඝෙ දින්නං න නස්සති"

සතර සංග්‍රහ වස්තු පිළිබඳව විස්තර කෙරෙන දහම් කලාප මාලාවේ දානය ගැන කියවෙන මේ තුන්වන ධර්ම පත්‍රිකාව යි. පසුගිය ජූනි 12 දිනට යෙදුණ පොසොන් කලාපයෙන් දානය පාරමිතාවක් බවට පත්වන අයුරු හා දන් දීමේ පරමාර්ථ පිළිබඳව ධර්මානුකූල විස්තරයක් සපයන ලදි. මෙම ධර්ම කලාපයෙන් සාංඝික දාන හා පෞද්ගලික දාන පිළිබඳව විස්තරයක් ඉදිරිපත් කරනු ලැබේ. - යුගාන්තයෙහි පෘථිවිය, මහා සාගරය, හා මහාමේරු පර්වතය විනාශ වී යන්නේ ය. එවැනි කල්ප ලක්ෂයක් ගිය ද සාංඝික දානයක ආනිශංසය විපාක දී අවසන් නොවන බව ඉහත සඳහන් ගාථාවෙන් දක්වා ඇත.

දානය ප්‍රධාන වශයෙන් පෞද්ගලික දාන හා සාංඝික දාන වශයෙන් ප්‍රභේද දෙකකි. පෞද්ගලික දාන යනු අසවල් භික්ෂූන් වහන්සේලාට හෝ භික්ෂූන් වහන්සේ නමක් හෝ අරමුණු කරගෙන සීමා සහිතව දන්දීම ය. ගිහි පුද්ගලයෙක් හෝ පුද්ගලයින් කීප දෙනෙකුට හෝ පෞද්ගලික වශයෙන් දන්දිය හැකි ය. සාංඝික දානය යනු සැරියුත් මුගලන් පරම්පරානුයාත අවිච්ඡින්නක මහා සංඝරත්නය ම සිහිපත් කොට ගෙන පොදුවේ දෙන දානය යි. ඉඩකඩම් හෝ ආහාරපානාදිය සඟසතු කොට පූජා කිරීමේ දී රැස්ව වැඩසිටින මහා සංඝයාට දෙමියි කියා හෝ අසවල් ගමේ අසවල් සංඝයාට දෙමියි කියා හෝ සීමාවන් ඇති කර ගැනීමෙන් ද සාංඝික දාන දිය හැකි ය. **"ඉමස්මිං සාලාය නිසින්නස්ස, සකලස්ස භික්ඛු සංඝස්ස දේම "** යනුවෙන් සඟසතු වාක්‍යය කියා පූජා කරන්නේ ඒ අනුව ය. එහෙත් උසස් ම සාංඝික දානය වන්නේ අපමණ මහා සංඝයා අරමුණු කොටගෙන -

" ඉමං භික්ඛං භික්ඛු සංඝස්ස දේම" යනුවෙන් පොදුවේ භික්ඛු සංඝයා වෙනුවෙන් දෙන දානය යි.

සාංඝික දානයක් දීමට නම් උපසපන් භික්ෂූන් වහන්සේලා සිවි නමක් වත් සිටිය යුතු යයි පිළිගැනීමක් ද ඇත. ධර්ම විනය පිළිබඳ විශාරද දැනුමක් ඇති මහාචාර්ය රේරුකානේ චන්දවිමල මහනාහිමිපාණන් වහන්සේ එක නමකින් වුව ද සාංඝික කළ හැකි බව උන්වහන්සේගේ " ධර්ම විනිශ්චය " නමැති ග්‍රන්ථයෙහි මෙසේ දක්වා ඇත. " දාන වස්තුවක් සාංඝික කිරීමේ දී එක් භික්ෂුවක් ඉදිරිපිට දී ද කළ හැකි ය. භික්ෂූන් දෙනමක් ඉදිරියේ දී ද කළ හැකි ය." ඉහත සඳහන් කළේ භික්ෂූන් වහන්සේලා දුර්ලභ ප්‍රදේශවල දී පොදු මහා සංඝයා අරමුණු කොට ගෙන එක නමකට වුව ද සාංඝික දානයක් දිය හැකි බව ය. සාංඝික දානයක් දීමට සිවි නමක් අවශ්‍ය ය" යන මතය ද පදනමක් ඇතිව ඇතිකර ගන්නා ලද්දක් බව පෙනේ. ධර්ම විනයානුකූලව බලන විට "පුග්ගල" යන්නෙන් එක් නමක් ගැනේ. " **ගණ** " යන වචනයෙන් ගැනෙනුයේ තුන් නමකි. " **සංඝ** " යන පදයෙන් සතර නමක් හෝ ඊට වැඩි ගණනක් හෝ පිළිගැනේ, " **සංඝ** " යන නාම පදයට " **ඉක** " යන ප්‍රත්‍ය යෙදීමෙන් " **සාංඝික** " යන තද්ධිත පදය සැදී ඇත. එහි තේරුම සංඝයාට අයිති යන්න යි. ඉහත සඳහන් කළ පරිදි සතර නමකට හෝ ඊට වැඩි ගණනකට හෝ අයිති යන තේරුම ගෙනදෙ යි. මේ ගැන සලකා බැලූ අපේ පැරැණ්නෝ සාංඝික දානයක් දීමට උපසපන් භික්ෂූන් සතර නමක් හෝ ඊට වැඩි ගණනක් හෝ සිටිය යුතු ය. යන අදහස ඇති කරගෙන ඇත.

සඟින්-සංඝයා ලබාගෙන දෙන සාංඝික දාන ක්‍රමයක් පිළිබඳව දක්ෂිණා විභංග සූත්‍රයෙහි සඳහන් වෙයි. " **එත්තකා මේ භික්ඛූ සංඝතෝ උද්දිසථාති දානං දේති. අයං ජට්ඨා සංඝගතා දක්ඛිණා** " සතර නමක් හෝ ඊට වැඩි හෝ සඟ පිරිසක් රැස්ව සිටින විට උන්වහන්සේලා වෙත ගොස් මට මෙපමණ භික්ෂූන් සංඝයාගෙන් ලබා දෙන්නට යැයි ආරාධනා කොට දන් දෙයි මේ සවැනි සංඝගත දක්ෂිණාව යි යනු ඉහත සඳහන් පාලි පාඨයේ අදහස යි. එසේ ආරාධිත සංඝයා අතුරෙන් එක නමක් හෝ දානයට පැමිණි විට ඒ නමට වුව ද තම පූජාවන් සාංඝික වශයෙන් පිරිනැමිය හැකි ය. බුදුරජාණන් වහන්සේ විසින් ම එක නමකින් සාංඝික වශයෙන් පිළිගැනීමට ද අනුමත කොට ඇති බව ද මහාවග්ග පාළියෙහි චීවරක්ඛන්ධකයෙහි දක්නට ඇත. **"ඉධ පන භික්ඛවේ භික්ඛූ උතුකාලං ඒකකෝ වසති. තත්ථ මනුස්සා සංඝස්ස දේමාති චීවරානි දෙන්ති. අනුජානාමි භික්ඛවේ තේන භික්ඛුනා තානි චීවරානි අධිට්ඨාතුං මය්හං ඉමානි චීවරානීති"** එක් භික්ෂුවක් පමණක් සිටින තැනක දී සංඝයාට දෙමි යි කියා සිවුරු පිදුවහොත් ඒවා ඒ භික්ෂුව පිළිගත යුතු ය. ඒ භික්ෂුව විසින් මේ සිවුරු මගේ යයි කියා ඉටා ගන්නට අනුදනිමි යනු -ඉහත සඳහන් පාළි පාඨයෙහි අදහස යි. එසේ අධිෂ්ඨාන කරගත් සිවුරු අයත් වන්නේ අදිටන් කරගත් භික්ෂුවට ය.පසුව උන්වහන්සේ ඒ සිවුරු සුරැකිව තබා සිවුරු අග හිඟකම් ඇති භික්ෂූන්ට දිය හැකි ය. දිය යුතු ය.

මෙසේ සාංඝික වශයෙන් පූජා කිරීමේ දී එයින් මහත් ඵල මහානිශංස ලැබෙන්නේ ය, දක්ඛිණා විභංග සූත්‍රයේ සඳහන් වන පරිදි මහා ප්‍රජාපති ගෝතමිය සියතින් ම කපු කැට වස්ත්‍රයක් විය සිවුරක් සදාගෙන බුදුරදුන්ට පූජා කළා ය. එවිට බුදුරජාණන් වහන්සේ වදාළ සේක් **" සංඝේ ගෝතමී දේහි සංඝේ තේ දින්නේ අහං චේව පූජිතෝ භවිස්සාමි "** - ගෝතමිය සංඝයා විෂයෙහි දෙන්න තොප විසින් සංඝයාට දුන් කල මට ද පිදුවා වන්නේ ය. යනුවෙනි. තෙවරක් ම එසේ ප්‍රකාශ කළ සේක් ප්‍රජාපති ගෝතමියගේ පූජාව මහත් ඵල මහානිශංස කරනු පිණිස ය. මහා ප්‍රජාපති ගෝතමිය ශාක්‍ය රාජ පවුලට ම අයත් කුමරිය කි. මහාමායා දේවියගේ බාල සහෝදරිය යි. කුඩා දා සිදුහත් කුමරුට සත් දින පිරෙත් ම මහාමායා දේවිය කලූරිය කළ බැවින්, බෝසතුන් හදාවඩා ගත්ති ප්‍රජාපති ගෝතමිය යි. ප්‍රජාපති ගෝතමියගේ පුතණුවන් වූ නන්ද කුමරුට කිරිමවුවරුන්ගේ පෝෂණය වැඩි වශයෙන් ලබා දෙමින් සිදුහත් කුමරු වෙනුවෙන් මෙතුමිය මවක සේම සැළකුවා ය. බුදුරජාණන් වහන්සේ බුදුබවට පත්ව වසරක් ගතවීමෙන් අනතුරුව මේ ප්‍රජාපති ගෝතමිය ද යශෝධරා ඇතුළු රාජකිය කුමරියන් පන්සියයක් මෙහෙණි සස්නක් පිළිබඳව ඉල්ලීමක් කළ අවස්ථාවේ දී බුදුරදුන් වදාළ සේක් එවැන්නකට මේ සුදුසු කාලය නො වන බව ය. වසර කිපයකින් පසු නැවත ද ප්‍රජාපති ගෝතමිය ඇතුළු ශාක්‍ය කුමරියන් මෙම ඉල්ලීම ඉදිරිපත් කළ අවස්ථාවේදී ද බුදුරදුන්ගේ පිළිතුර වූයේ මෙහෙණි සස්නට තවම සුදුසු කාලය නො වන බව ය. එයට හේතුව රට පුරා ව්‍යාප්තව පැවති බ්‍රාහ්මණ සමාජය කාන්තාවට තැනක් දී නො තිබුණ හෙයිනි මනුස්මෘතිය ආදී ඈත කාලීන වේද ග්‍රන්ථවල සඳහන් වන පරිදි.

" බාල්‍යෙ පිතුර්වසේ තිෂ්ඨේත් - ප්‍රාණිග්‍රාහස්‍ය යෞවනේ
පුත්‍රානාං භර්තරි ප්‍රේතේ - න භජේත් ස්ත්‍රී ස්වතන්ත්‍රතාම් "

බාල ගැහැණු දරුවන් පියාණන්ගේ දැඩි අණසක යටතේ ද තරුණ කාන්තාවන් සැමියාගේ අණසක යටතේ ද මහලූ මවක් බවට පත්වූ පසු පුතණුවරුන්ගේ අණසක යටතේ ද ජීවත්විය යුතු අතර - කාන්තාවන්ට කවරදාකවත් ස්වාධීනව, ස්වතන්ත්‍රතාවයෙන් ජීවත්වීමට ඉඩ නො තැබිය යුතු ය." යන අදහස් කාලාන්තරයක් පුරා පැවති සමාජයක - සසුන ස්ථාවර වන තුරු එනම් කලක් ගතවන තුරු මෙහෙණි සස්න ආරම්භ කිරීමට කල් දැමීම බුදුරදුන්ගේ විචක්ෂණ බුද්ධිමත් ක්‍රියාවක් බව පිළිගත යුතු ය. ඒ බව පැහැදිලිව දන්නා බුදුපියාණන් වහන්සේ, දේව - බ්‍රහ්ම - ජෙන යන බලගතු ආගම් මැද ආරම්භ කළ මේ බුදුදහම ව්‍යාප්ත වන තුරු මෙහෙණි සස්නක් හඳුන්වා දීම ශාසන පැවැත්මට අහිතකර බව දන්නා බැවින් කලක් ගතවන තුරු එය කල්දැමූ සේක. බුද්ධත්වයෙන් පස්වැනි වර්ෂයේ දී සුද්ධෝදන මහාරාජයාගේ අභාවයෙන් පසු - පන්සිය ගණනක් රාජ කුමරියන් සමග මෙහෙණ වෙස් ගෙන විශාලා මහනුවරට ගොස් පැවිද්ද ඉල්ලූ විට අෂ්ට ගරුධර්ම වදාරා කාන්තා පක්ෂයට ද පැවිද්ද ලබා දුන්හ. මේ අවස්ථා තුනේ දී ම මැදහත් ව ක්‍රියා කළෝ අනද මහ තෙරණුවෝ ය.

මේ නිසා ප්‍රබෝධයට පත් දඹදිව් වාසී දැන උගත් බොහෝ කාන්තාවෝ ද, ලැබුණු මේ අසිරිමත් නිදහසින් ප්‍රයෝජන ගනිමින් දහස් ගණනින් - දස දහස් ගණනින් පැවිද්දට පත්වූහ. සුද්ධෝදන - බිම්බිසාර - කෝසල - උදේනි ආදි දඹදිව සුවිශාල ප්‍රදේශයන් පාලනය කළ රජවරු ද,අනාතපිණ්ඩික - ජෝතිය - ජටිල - ධනමෙණ්ඩක, උපාලි ආදි බල පරාක්‍රමය පතුරුවාගෙන සිටි ධනේශ්වර සිටුවරු ද, විශාඛා - වන්ද්‍රපදුමා - බන්ධුල මල්ලිකා ආදි සිටුදේවිවරියන් ද සහපිරිවරින් බෞද්ධයන් බවට පත්ව සිටි නිසා මෙහෙණි සස්නක් පිහිටුවාලීම පිළිබඳව බ්‍රාහ්මණ අභියෝගයට මුහුණ දීමට සිදුවූයේ නැත. මෙසේ ශාසනය ස්ථාවර වන තුරු " මෙහෙණි සස්නක් ඇතිකිරීමට මේ කාලය නොවේ" යයි බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කරන ලද සේක්, මේ නිසා බව සැලකිය යුතු ය.

මේ ප්‍රජාපති ගෝතමිය මහත් වූ සැදැහැ සිතින් සහ දරු සෙනෙහසින් යුතුව " ඌටලි කපු වර්ගයට අයත් අගනා කපු වලින් නූල් සකස් කොට වස්ත්‍රයක් සිවුරක් සේ සකසා බුදුරජාණන් වහන්සේට පූජා කළ විට උන්වහන්සේ එය ප්‍රතික්ෂේප කරමින් " ප්‍රජාපති ගෝතමියෙනි, මෙම අගනා සිවුර ඔබේ ම දැතින් කරන ලද්ද කි. එසේ ම අගනා කපු පුළුන්වලින් වස්ත්‍රයක් නිම කොට එය කපා - කොටා - මසා - පඬු පොවා පිළියෙල කරන ලද්දක් බැවින් පොදුවේ ම මහා සංඝයාට පූජා කරන්නැ"යි තමා වෙත පිදූ චීවරය මහා සංඝරත්නය වෙත පූජා කිරීමට යොමුකළ සේක. එයින් පැහැදිලි වන්නේ බුදුරදුන් ප්‍රමුඛ සාරිපුත්ත - මොග්ගල්ලාන මහාකාශ්‍යපාදි අපරිමිත සඟ පරපුර උදෙසා පූජා කිරීම ආනිශංස බහුල වීමට හේතුවන බව ය. දැනුදු-එදෑ මෙදෑතුර වැඩ සිටි - වැඩ සිටින සකලවිධ මහා සංඝයා වහන්සේ වෙනුවෙන් " **භික්ඛුසංඝස්ස දේම**" යනුවෙන් පූජාර්හ වස්තු සඟසතු කොට ම පූජා කරන්නේ එහෙයිනි.